# 1.26 බෞද්ධ හා සාංඛ්‍ය දර්ශනයන්හි සම-විෂමතා පිළිබඳ තුලනාත්මක අධ්‍යයනයක්

පූජ්‍ය වලපනේ ඤාණසේන හිමි
සංස්කෘත අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

## ABSTRACT

ප්‍රාග් බෞද්ධ යුගයේහි දී ආරම්භ වී යැයි සැලකෙන සාංඛ්‍ය දර්ශනයෙහි ආදිකර්තෘ කපිල ඍෂිවරයා යි. උපනිෂද් ග්‍රන්ථයන්හි මෙන් ම මහාභාරතයෙහි ද මෙහි මූලබීජ දක්නට ලැබෙන අතර විශ්වයත් එහි නිර්මාණයත් පිළිබඳ බුද්ධිමත් ව කල්පනා කර සැකසුණු දර්ශනයක් වශයෙන් බුද්ධිමතුන් විසින් සම්භාවිත සාංඛ්‍ය දර්ශනය බෞද්ධ දර්ශනාගත මෞලික සිද්ධාන්ත හා සංකල්පයන් සමග සැසඳීමේ දී (අනෙකුත් දර්ශනයනට වඩා) සමතාවන් පෙන්නුම් කරයි. විෂමතා ද නැත්තේ නො වේ.

විශ්වය පිළිබඳ භෞතික මූල හේතුව වන *(Material Cause)* ප්‍රකෘතිය හා විඥානමය මූල හේතුව වන *(Interligent Cause)* පුරුෂ ද යන පදාර්ථද්වය සාංඛ්‍ය දර්ශනයේ ඉගැන්වෙන ප්‍රධාන මූලධර්ම යුගලය යි. ඒ අතර ප්‍රකෘතිය මුලුමනින් ම භෞතික ය. අන්ධ ය. පුරුෂගේ නිරීක්ෂණය ප්‍රකෘති කෙරෙහි යොමුවීමෙන් එහි සංයුතිය වන ත්‍රෛගුණ්‍යයේ සමතුලිතය බිඳීයෑම විශ්ව පරිණාම ක්‍රියාවලියේ ආරම්භය වේ.

බෞද්ධ දර්ශනයේ එන නාම-රූප මූලධර්ම යුගලය ද වෙන් වෙන් ව නො පවත්නා අතර නාමය නිසා රූපය ද රූපය හේතුකොටගෙන නාමය ද පවත්නා බව පැහැදිළි කරයි. තව ද නාම-රූප දෙදෙනාගේ සංයෝගයෙන් විශ්වයේ (ශරීරයේ) නිර්මාණයත් එහි ක්‍රියාකාරීත්වයත් ඇති වේ.

බෞද්ධ නාම - රූප ධර්ම විභාගයේ දී හා සාංඛ්‍යයන් ගේ ප්‍රකෘති - පුරුෂ විවරණයේ දී, මේ දෙකෙහි සහයෝගී ක්‍රියාකාරීත්වය දැක්වීමට දර්ශනද්වය ම ගෙනහැර දක්වා ඇත්තේ ' අඳ පිළු ' උපමාව යි.

බෞද්ධ හා සාංඛ්‍ය දර්ශනාගත සංකල්ප කිහිපයක් පිළිබඳව ආචාර්ය **කර්න් මහතා** *(Manual of Indian Buddhism)* කර ඇති සැසඳීමක් මෙසේ ය.

| **බෞද්ධ දර්ශනයේ** | **සාංඛ්‍ය දර්ශනයේ** |
|---|---|
| අවිද්‍යාව *(NESCIENCE )* | ප්‍රකෘති *(FIRST COUSE )* |
| විඥානය *(CONSCIOUSNESS )* | බුද්ධි *(THE INTELLECT )* |
| ෂඩායතන *(SIX BASES )* | ෂොඩශක ගණය *(THE GROUP OF SIXTEEN )* *(The Eleven Organs and the Five Subtle Elements)* |

බෞද්ධ නාම - රූප සමග සාංඛ්‍යයන්ගේ පස්විසි තත්ත්වයන් ( Catergories ) බොහෝ සෙයින් සම වන අතර එපමණට ම විෂම ද වේ. බෞද්ධයන් විසින් නාම ධර්මයන් සේ ගැනෙන්නක් සාංඛ්‍යයෝ ඇතැම් විටක රූප ධර්මයන් සේ ගනිති. සාංඛ්‍යයන් රූප ධර්මයන් සේ ගනු ලබන්නක් බෞද්ධයෝ නාම ධර්මයන් සේ ගනිති.

සාංඛ්‍ය දර්ශනයේ ස්ථාපිත ආත්මීය පුරුෂ පදාර්ථය වැනි තත්ත්වයක් බෞද්ධ දර්ශනයේ දක්නා නො ලැබේ. ඇත්තේ මොහොතක් පාසා වෙනස්වන විඥාන ප්‍රවාහයකි. සාංඛ්‍යයන්ගේ ත්‍රෛගුණ්‍යය බෞද්ධ ත්‍රිවිධ අකුශල මූලයනට හෝ කුශල මූලයනට සමකළ නො හේ.

කේවල භෞතිකවාදී මාක්ස්වාදය (Marxism) මෙන් හෝ ආත්මීය විඥානවාදය (Subjective Idealism) මෙන් හෝ ඒකාන්තවාදී නො වී මධ්‍යම මාවතක ගමන් කරන සාංඛ්‍ය දර්ශනය බෞද්ධ දර්ශනය සමග සංසන්දනය කිරීම කාලෝචිත අධ්‍යයනකැ යි හඟිමි.